# නැමෝම සම්බන්ධ කිරීම: ඊ-ශ්‍රී ලංකා ව්‍යාපෘතියට ලෝක බැංකු ආධාර

කොළඹ. 21 සැප්තැම්බර් 2004-

ලෝක බැංකුවේ ප්‍රථම ඒකාබද්ධ විද්‍යුත් (ඊ) සංවර්ධන ව්‍යාපාතිය වන ඊ-ශ්‍රී ලංකා ව්‍යාපෘතිය සඳහා, අද ලෝක බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 53ක ණයක් අනුමත කරන ලදී. ජනතා සේවා දියුණු කරනු පිණිසත්, පෞද්ගලික අංශයේ තරඟකාරීත්වය අධික කරනු පිණිසත්, සංවර්ධනය සඳහා නව මං වර්ධනය කොටගනු පිණිසත්, සමාජ සංවර්ධන වේගය සීඝ්‍ර කරනු පිණිසත්, විද්‍යුත් සන්නිවේදන පරතරය පටු කරනු පිණිසත්, එමෙන්ම සාමයට සහයෝගය සපයනු පිණිසත්, මේ ඊ-ශ්‍රී ලංකා ව්‍යාපෘතිය විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණයට පෘථුල අනුබලයක් සැපයෙන්නේය.

ලෝක බැංකුවේ ශ්‍රී ලංකා නේවාසික අධ්‍යක්ෂක තැන්පත් පීටර් හැරල්ඩ් මෙසේ පවසන්නේය: "මෙය සිත් ගන්නා සුළු වැඩ පිළිවෙලකි. ඒ ව්‍යාපෘතියට සහාය සපයන්නට ලැබීම ගැන අපි සතුටුවන්නෙමු. අප විසින් මේ දේශය උදෙසා ක්‍රියාවේ යොදවනු ලබන ක්‍රමෝපායයෙහි ප්‍රධාන අරමුණු තුනකට මේ ව්‍යාපෘතියෙන් සහාය සැපයෙන්නේය: උතුර සහ දකුණ යාකිරීමෙන්, මේ වැඩ පිළිවෙල විසින්, සාමය තහවුරු කෙරෙන්නේය: තොරතුරු තාක්ෂණය පිළිබඳ ක්ෂේත්‍රයෙහි පමණක් නොව, සෙසු අංශවලත් නිෂ්පාදන ශක්තිය දියුණු කිරීමෙන් මේ ව්‍යාපෘතිය විසින් සංවර්ධන බලාපොරොත්තු අධික කෙරෙන්නේය: එමෙන්ම, මහජන සේවා රැසක් ලබාගන්නට දිළිඳු අය සතු අවස්ථා වැඩි කිරීමෙන් මේ ව්‍යාපෘතිය විසින් සමානාත්මතාවය ඉදිරියට ගෙන යනු ලැබේ."

විද්‍යුත් පරතරය, පටු කරන අරමුණෙන්, ඊ-ශ්‍රී ලංකා සංවර්ධන ව්‍යාපෘතිය විසින්, පෘථුල ක්‍රියාමාර්ගයක් අනුගමනය කෙරෙයි. ජගත් ව්‍යාප්ත දැනුම් ආර්ථිකය නිසා සැලසෙන සුබසෙත, මේ ව්‍යාපෘතිය කරණකොටගෙන, ශ්‍රී ලංකාවේ නාගරික මධ්‍යස්ථානවලට මෙන්ම දිළිඳු ගැමියන්ටද එකසේ සැපයෙන්නේය. ආර්ථිකයේ ප්‍රධාන අංශ සියල්ලේම සංවර්ධනයට පහසුකම් සපයන සාධකය වන්නේ, දේශය පුරාම තොරතුරු සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීමයි.

"සෞභාග්‍යය දිනාගැනීමේත්, බෙදා හැරිය හැකි වන සම්පත් බහුල කිරීමේත්, ප්‍රධාන මාර්ගය" වශයෙන්, ලෝක බැංකුවේ ශ්‍රී ලංකා ආධාර සම්පාදක ක්‍රමෝපායය (සීඒඑස්) විසින් හඳුනාගෙන තිබෙන්නේ, ආර්ථික සංවර්ධනයයි. ස්ථාවර ඊ-සංවර්ධන ක්‍රියාදාමයකට අත්තිවාරම සම්පාදනය කිරීමෙන්, සාමයට, සංවර්ධනයට සහ සමාන අවස්ථාවලටත් සහයෝගය සපයමින්, ඊ-ශ්‍රී ලංකා ව්‍යාපෘතිය විසින්, "ශ්‍රී ලංකා ආධාර සම්පාදක ක්‍රමෝපායයේ (සීඒඑස්) අරමුණ වන, දිළිඳුකම අවම කිරීමේ ප්‍රතිපත්තිය" ක්‍රියාවේ යොදවනු ලැබේ.

මේ පොදු දර්ශනය හැඩ ගස්වමින්, ඉන් සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමේ වගකීම භාරව සිටින, ඉහළම සංවිධානය නම් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනයයි. ශ්‍රී ලංකාවේ නායකත්වය, ජනතාව, පෞද්ගලික අංශය සහ ජාත්‍යන්තර සංවිධානත් ඒකාබද්ධ කොට ගනිමින්, මේ ව්‍යාපෘතිය ක්‍රියාවේ යෙදවීමේ කාර්යය, එම ආයතනය විසින් පහසු කරනු ලබන්නේ එහි අංග හයකින් යුත් වැඩ පිළිවෙළ මගිනි. ඒ සය වැදෑරුම් අංග මෙසේය: ඊ-ප්‍රතිශක්තිය, නායකත්වය සහ ආයතන වර්ධනය කිරීමේ වැඩ පිළිවෙල, අධ්‍යාපනය සහ කාර්මික ව්‍යාපාර දියුණු කිරීමේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩ පිළිවෙළ, කලාපීය විදුලි සන්දේශ ජාලා සංවර්ධන වැඩ පිළිවෙළ, විද්‍යුත් මධ්‍යස්ථාන සංවර්ධන වැඩ පිළිවෙල, රාජ්‍ය ප්‍රතිව්‍යුහකරණ වැඩ පිළිවෙල සහ ඊ-සමාජ වැඩ පිළිවෙළත්ය. අදහස් හඳුනාගත් අවශ්‍යතා, ක්‍රියාවේ යෙදීමට බාධා වශයෙන් සළකන ලද දේත්, පරීක්ෂාවට ලක් කළ ව්‍යාපෘති සැලසුම් කිරීමේ පියවරේ දී කරන ලද ආයෝජන මගින් සකස් කළ පුරෝගාමී ව්‍යාපෘති, මේ වැඩ පිළිවෙළට පදනම් වෙයි.

ලෝක බැංකුවේ ඊ-ශ්‍රී ලංකා කාර්ය සාධක කණ්ඩායමේ නායක, ඊ-සංවර්ධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක නොප් හතා මෙසේ පවසන්නේය: ඊ-ශ්‍රී ලංකා ව්‍යාපෘතිය විසින් දිනාගන්නට අදහස් කෙරෙන උසස් පරමාර්ථය නම්, ශ්‍රී ලංකාව, සිය ජනතාව හා සමග ඉහළම මට්ටමෙන් සම්බන්ධ වූ රාජ්‍යය බවට පත් කිරීමයි. මහජන සේවා ලබාගැනීමේත්, අධ්‍යාපන අවස්ථා ලබාගැනීමේත්, තොරතුරු ලබාගැනීමේත් වඩා හොඳ වරප්‍රසාද සහිතව, ශ්‍රී ලංකාවේ පුරවැසියන් සියලු දෙනාටම සිය දිවි-පෙවෙතෙහි ගුණාත්මක බව දියුණු කොට ගන්නට ද උපකාරීවීමත් මේ ව්‍යාපෘතියේ උසස් පරමාර්ථයයි.

අන් හැමටම වඩා ප්‍රධාන වන්නේ මෙයයි. හුදෙකලාවූ ජන කණ්ඩායම්වලට, තොරතුරු සන්නිවේදන තාක්ෂණය මගින් දැනුම ලබාදීමත්, ඔවුන් සෙස්සන් හා සම්බන්ධ කිරීමත් ඔවුන්ට ශක්තිය සැපයීමත් මේ වැඩපිළිවෙලේ අරමුණු වෙයි. එමෙන්ම, වඩාත් යහපත් අනාගතයක් පිළිබඳ සිහින මවන්නට සහ බලාපොරොත්තු ඇති කොට ගන්නට ගොවීන්ට, ශිෂ්‍යයන්ට සහ කුඩා පරිමාණයේ ව්‍යවසායකයන්ටද බලාරෝපණය කිරීම ද මෙහි අරමුණකි. මේ යෝජිත ව්‍යාපෘතිය, 2004 නොවැම්බර් මාසයේ දී ආරම්භ වී, අවුරුදු පහක් මුලුල්ලේ ක්‍රියාත්මක වන්නේය. ලෝක බැංකුවේ සහනදායී ණය සම්පාදක අංශය වන ජාත්‍යන්තර සංවර්ධන සංගමය (අයි.ඩී.ඒ.) විසින්, ඒ සංගමයේ සම්මත කොන්දේසිවලට අනුව මේ ඇමෙරිකානු ඩොලර් මිලියන 53නේ ණය දීමනාව, ශ්‍රී ලංකා රජයට සපයන්නේය. අවුරුදු හතලිහකින් ගෙවා නිමවිය යුතු මේ ණය දීමනාව සඳහා දස වසක සහන සමයක් ද ලැබෙන්නේය.

ශ්‍රී ලංකාවේ ලෝක බැංකු ව්‍යාපාර පිළිබඳව තවත් තොරතුරු දැනගැනීම සඳහා මෙසේ විමසන්න.

http://www.worldbank.org/lk.